# ශ්‍රීන් සරුර් එ. අග්‍රාමාත්‍ය කාර්යාලය

RTIC Appeal (පෞද්ගලික විභාග කිරීම)/01/2018 - 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන් හි (ගාස්තු සහ අභියාචනා කාර්යයපටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යයපටිපාටිය -

මෙම අභියාචනා විභාගය 15.05.2018 දින පැවති කොමිෂන් සභා රැස්වීමේ කොටසක් ලෙස පවත්වන ලදී.

**සභාපති -** මහින්ද ගම්මන්පිල

**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන

**කොමිෂන් සභා සාමාජික -** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා

**කොමිෂන් සභා සාමාජික -** ආචාර්ය සෙලවී තිරුචන්ද්‍රන්

**කොමිෂන් සභා සාමාජික -** විනිසුරු රෝහිනී වල්ගම

**අධ්‍යක්‍ෂ ජනරාල් -** පියතිස්තස රණසිංහ

**අභියාචක -** ශ්‍රීන් ඒ සරුර්

**නොතීසි ලත් පාර්ශව -** ඊ එම් එස් බී ඒකනායක, නම්කළ නිලධාරී/ අග්‍රාමාත්‍ය ලේකම්

**පෙනීසිටීම**

**අභියාචක -** ශ්‍රීන් ඒ සරුර්

සංජිත ගුණරත්න, කළමනාකරු - තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳ, ට්‍රාන්ස්පෙරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL) (අභියාචක සමඟ)

ලක්විජය බණ්ඩාර, TISL

මංගල ශංකර්, ALAC, TISL

**පොදු අධිකාරිය -** සුරේන් ඥානරාජ්, රජයේ නිතීඥ, නීතිපති දෙපාර්තමේන්තුව

හෂිනි ජයසේකර, තොරතුරු නිලධාරී/ උප ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය: | 21.06.2017 |
| තොරතුරු නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 22.06.2017 (ලිපිය ලත් කුවිතාන්සිය)<br>07.07.2017 |
| නම්කළ නිලධාරියා වෙත අභියාචනය යොමු කළ දිනය: | 22.07.2017 |
| නම්කළ නිලධාරියා තීරණය ලබා දුන් දිනය: | 27.07.2017<br>(ලිපිය ලැබූ දිනය - 31.07.2017) |

| RTIC කොමිෂන් සභාව වෙත අභියාචනය යොමු කළ දිනය: | 06.10.2017 |
|---|---|

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක, 21.06.2017 දින ලිපියක් මඟින් සංහිඳියා යාන්ත්‍රයණ පිළිබඳ සම්බන්ධීකරණ ලේකම් කාර්යාලයට අදාලව පහත සඳහන් තොරතුරු අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ඉල්ලා සිටින ලදී.

A. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30/1 සම්මතය (UN HRC 30/1) සම්බන්ධව පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග වලට අදාළ යෝජනා/ නීති කෙටුම්පත්/ සංකල්ප සටහන්/ ලිපි ලේඛන වල පිටපත්:
   a. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයක් ස්ථාපනය කිරීම
   b. සත්‍ය ගවේෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
   c. විශේෂඥ නීතිඥයින් ඇතුලත් අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
   d. සත්‍ය ගවේෂණය, යුක්තිය, හානිපූරණය සහ ප්‍රතිවර්තනය වැළැක්වීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග ස්ථාපනය කිරීම

B. ඉහත සඳහන් යෝජනා/ නීති/ කෙටුම්පත්/ සංකල්ප සටහන්/ ලිපි ලේඛන වලට අදාලව දේශීය/ අන්තර්ජාතික උපදේශකවරුන්/ ප්‍රවීණයන් සමඟ කරනු ලැබූ සමාලෝචන/ සන්නිවේදන/ සාකච්ඡා/ ලිපි ලේඛන කෙටුම්පත් වල පිටපත්

C. UN HRC 30/1 ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගනු ලැබූ ක්‍රියා සැලසුම් වල පිටපත/ පිටපත්

තොරතුරු නිලධාරියා 07.07.2017 දිනැති ලිපිය මඟින් පිළිතුරු දක්වමින් පවසා සිටියේ, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට අදාළව පනත් දෙකක් පොදු ලියවිලි බවට පත් කර ඇති බවත්, එම ලියවිලි documents.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත් හැකි බවයි. ඉල්ලා සිටින ලද අනෙකුත් තොරතුරු පනතේ 5(1)(ක) ප්‍රකාරව තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයන් සම්බන්ධ වන හෙයින්, ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී. ඉහත තොරතුරු වලින් සෑහීමකට පත් නොවූ හෙයින් අභියාචක 22.07.2017 දින නම්කළ නිලධාරියාට අභියාචනයක් ඉදිරිපත් කරන ලදී. එයට පිළිතුරු වශයෙන් 31.07.2017 දිනැති ලිපියෙන් අභියාචක හට ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශයට අභියාචකගේ තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කර ඇති බව පෙන්වන ලිපි දෙකක් නම්කළ නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලදී. අභියාවාක විසින් මෙය පොදු අධිකාරියේ තීරණයක් ලෙස නොසැලකූ හෙයින්, නම්කළ නිලධාරියාගෙන් තීරණයක් නොලද බව දන්වමින් 06.10.2017 දින කොමිෂන් සභාවට අභියාචනාවක් ඉදිරිපත් කරන ලදී.

**අභියාචනා අවස්ථාවේ උද්ගත වූ කාරණා:**

පොදු අධිකාරිය 03.05.2018 දින කොමිෂන් සභාවට මේ සම්බන්ධව ඉදිරිපත් කරන ලද ලිඛිත දේශනයේදී ඔවුන් සඳහන් කර සිටියේ පොදු අධිකාරිය, අභියාචකගේ අභියාචනයට 27. 07.2017 දින පිළිතුරු ඉදිරිපත් කළ බවයි. එහි පිටපතක් ලිඛිත දේශනය සමඟ ඉදිරිපත් කර ඇත. පොදු අධිකාරිය කරුණු දක්වමින් තවදුරටත් පවසා සිටියේ ඔවුන් අභියාචකගේ ඉල්ලීම ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශයට 27. 07.2017 දින (අභියචකට පිටපතක් සහිතව) ඉදිරිපත් කළ අතර අංක 2004/66 දරන ගැසට් පත්‍රයේ නියෝග අංක 04(vi) යටතේ පනත ප්‍රකාරව තම වගකීම ඉටු කර ඇති බවයි.

නියෝග අංක 04(vi) මෙසේ සඳහන් කරයි.

*“ඉල්ලා සිටින තොරතුරු වෙනත් ආයතනයක් සතුව ඇති බව තොරතුරු නිලධාරියා දන්නේ නම් අයදුම්පත එකී තොරතුරු තබාගෙන ඇති පොදු අධිකාරියේ තොරතුරු නිලධාරියා වෙත යවා ඒ බව අයදුම්කරුට ලිඛිතව දින 07 තුල දන්වා යැවිය යුතුය.”*

තවද, නියෝග අංක 4(vii) මෙසේ සඳහන් කරයි.

*“ තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම උදෙසා අලුතින් තොරතුරු එක්රැස් කිරීමට පොදු අධිකාරියක් කටයුතු කිරීම අවශ්‍ය නැත. එහෙත් ඉල්ලීම ප්‍රතික්ෂේප නොකර, පොදු අධිකාරිය සතුව පවත්නා වාර්තා…”*

ඒ අනුව පොදු අධිකාරිය කරුණු දක්වමින් පවසා සිටියේ පොදු අධිකාරිය මෙම ඉල්ලීම අදාළ අධිකාරිය වෙත ඉදිරිපත් කළ හෙයින් අභියාචක හට පනත සහ එහි රෙගුලාසි ප්‍රකාරව තම අධිකාරියට එදිරිව නෛතික ක්‍රියාමාර්ගයක් ගත නොහැකි බවයි. පොදු අධිකාරිය තව දුරටත් පවසා සිටියේ අභියාචක නම්කළ නිලධාරී ලබා දුන් ප්‍රතිචාරය අනාවරණය නොකළ නිසාවෙන් මෙම අභියාචනය නීතියෙන් දුර්වල වන බවත් අභියාචකට පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කාලය ඉකුත් වීම හේතුවෙන් අභියාචනයක් ඉදිරිපත් කල නොහැකි බවයි. ඒ මන්ද යත් නම්කළ නිලධාරීගේ පිළිතුර 31.07.2017 වන විට අභියාචක සතුවූ අතර කොමිෂන් සභාවට අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ 06.10.2017 දින වේ. එනම් තීරණය ලැබී මාසයක කාලයක් ඉකුත් වීමෙන් අනතුරුව වීමයි.

මෙයට අමතරව පොදු අධිකාරිය තම ලිඛිත දේශනයේ කරුණු දක්වමින් පවසා සිටියේ තම සන්තකයේ, භාරයේ හෝ පාලනයේ වූ තොරතුරු පිළිබඳ ව නොවුවද, තමා පහත ඉදිරිපත් කරන ලද තොරතුරු වෙනත් අධිකාරීන්ගෙන් ක්‍රියාශීලීව ලබා ගැනීමට කටයුතු කල බවයි.

A අයිතමයට අදාලව:

A. a. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයක් ස්ථාපනය කිරීම
- 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) පනත (වෙබ් අඩවියෙන් ලබාගත හැකිය)
- 2017 අංක 09 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම) සංශෝධන පනත (වෙබ් අඩවියෙන් ලබාගත හැකිය)
- අතුරුදහන් වූ තැනැත්තන් පිළබඳ කාර්යාල පනතේ (සංශෝධිත) 1(2) වගන්තිය යටතේ නියෝගය ප්‍රකාරව පළ කළ 12.09.2017 දිනැති අංක 2036/21 දරන ගැසට් පත්‍රය

b. සත්‍ය ගවේෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම

- 17.11.2016 දින ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය පිළිබඳ උපදේශක කාර්යසාධක අවසන් වාර්තාව (Consultation Task Force on Reconciliation Mechanisms - CTF) (වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය)

c. වන්දි ලබා දීමේ කාර්යාලයක් ස්ථාපනය කිරීම

- 05.03.2018 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ 06.03.2018 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය

d. විශේෂඥ නීතිඥයින් ඇතුලත් අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම
- 17.11.2016 දින ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය පිළිබඳ උපදේශක කාර්යසාධක අවසන් වාර්තාව (CTF) (වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය)

e. සත්‍ය ගවේෂණය, යුක්තිය, හානිපූරණය සහ ප්‍රතිවර්තනය වැළැක්වීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග ස්ථාපනය කිරීම

- 07.03.2018 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද බලහත්කාරයෙන් අතුරුදහන් කළ පුද්ගලයින් ආරක්ෂා කිරීමේ ජාත්‍යාන්තර සම්මුතිය පිළිබඳ පනත (International Convention for the Protection of All persons from Enforced Disappearances Bill)
- පුද්ගල නාශක බිම් බෝම්බ භාවිතය, ගබඩා කිරීම සහ නිශ්පාදනය තහනම් කිරීම පිළිබඳ ඔටාවා සම්මුතියට (Sri Lanka's accession to the Ottawa Convention on the Prohibition on the Use, Stockpiling, Production and Transfer of Anti-Personnel Mines and on their Destruction) ශ්‍රී ලංකාව ප්‍රවේශ වීම පිළිබඳ 11.12.2017 සහ 12.12.2017 දිනැති සමූහ අමාත්‍ය මණ්ඩල සංදේශය
- වධ හිංසාවට සහ අනෙකුත් කුරිරු, අමානුෂික හා අවමන් සහගත ලෙස සැලකීම හෝ දඬුවම් කිරීමට එරෙහි සම්මුතිය සඳහා වන විකල්ප පෙරාතුකොලය වෙත ශ්‍රී ලංකාවේ ප්‍රවේශය සම්බන්ධ (Sri Lanka's accession to the Optional Protocol to the Convention against Torture and other cruel, inhuman and degrading treatment or punishment) 10.11.2017 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සහ 14.11.2017 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය

C අයිතමයට අදාලව:

UN HRC 30/1 ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ගනු ලැබූ ක්‍රියා සැලසුම් වල පිටපත/ පිටපත්

- 01.11.2017 දිනැති මානව හිමිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය සඳහා වූ ජාතික ක්‍රියා සැලැස්ම 2017 – 20121 (වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය)

අභියාචක කොමිෂන් සභාව ඉදිරියේ ප්‍රකාශ කළ සිටියේ මානව හිමිකම් ක්‍රියාකාරිනියක ලෙස ඇය මෙම තොරතුරු ඉල්ලා සිටින අතර ඇය ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය සම්බන්ධයෙන් සිදුවෙමින් පවතින දෑ පිළිබඳව තොරතුරු ලබාගැනීමට උනන්දුවෙන් සිටින පීඩාවට පත් පුද්ගලයන් සමඟ විවිධ වැඩමුළු පවත්වා ඇති බවයි. අභියාචක වැඩිදුරටත් පවසා සිටියේ ඇය සහ අනෙකුත් පාර්ශ්වයන් CTF ක්‍රියාවලිය සඳහා සහභාගී වූ බවත්, එබැවින් සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමය ස්ථාපනය කිරීමට රජය CTF ක්‍රියාවලියේ නිර්දේශයන් සැලකිල්ලට ගෙන ඇත්දැයි විමසීමට මෙම තොරතුරු ඉල්ලා සිටි බවයි.

අතුරුදහන්වූවන්ගේ පවුල්වල සාමාජිකයින් සමඟ කටයුතු කරන ඇය සහ අනෙකුත් ක්‍රියාධරයින් ගේ මතය වනාහි අතුරුදහන් වූවන් පිළිබඳ වූ පනත සම්මත කරනු ලැබ ඇත්තේ පීඩාවට පත් ජනයාට රහසිගත තොරතුරු ලබා ගැනීමට ඇති ඉඩකඩ අහුරමින් බව පවසා සිටි අභියාචක තවදුරටත් ප්‍රකාශ කර සිටියේ සංක්‍රාන්තික යුක්තිය ඇති කිරීමට ස්ථාපනය කරන සෑම ආයතනයක්ම විනිවිද භාවයකින් සහ වගවීමක් සහිතව කටයුතු කල යුතු බවයි. කොළඹ සීමාව තුළ තීරණය කරනු ලබන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට ප්‍රාදේශික ක්‍රියාකාරීන්ගේ සම්බන්ධතාවයක් නොමැති හෙයින් මෙම තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කල බව අභියාචක නිරීක්ෂණය කර සිටියි.

පොදු අධිකාරිය අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පිළිබඳව තමා ඉදිරිපත් කල ලිඛිත දේශනයට කොමිෂන් සභාවේ අවධානය යොමු කරමින් පවසා සිටියේ මේ පිළිබඳව පිළිතුරු දක්වීමට පොදු අධිකාරිය ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශයට තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කළ බවත් ඉතිරි තොරතුරු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීමට විදේශ කටයුතු අමාත්‍යාංශයට තමා තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කළ බවයි.

පොදු අධිකාරිය තව දුරටත් පවසා සිටියේ නම්කළ නිලධාරියාගේ තීරණය මත තොරතුරු ඉල්ලීම විෂය භාර අමාත්‍යාංශ වෙත 27.07.2017 දින ඉදිරිපත් කල බවයි. අභියාචකද මෙය සනාථ කරමින් පවසා සිටියේ තමා විෂය භාර අමාත්‍යාංශ වලට තොරතුරු ලබා දෙන මෙන් ඉල්ලා ලිපි ඉදිරිපත් කළ බවයි. ඔවුන් තවදුරටත් පවසා සිටියේ මෙම කරුණ ඉදිරිපත් නොකිරීම මගින් පොදු අධිකාරිය අදාළ විෂය භාර අමාත්‍යාංශ වෙත ලිපි මගින් තොරතුරු පොදු අධිකාරියට ඉදිරිපත් කරන ලෙසට ඉල්ලීම් කළ බවට නිවැරදි නොවූ මතයක් හඟවන බවයි.

අභියාචක කරුණු දක්වමින් පවසා සිටියේ ඇයට පොදු අධිකාරිය විසින් එවනු ලැබූ 31.07.2017 දිනැති ලියුම හිමිවූ බවත් අභියාචක එය යොමු කිරීමක් පිළිබඳව මිස පොදු අධිකාරියේ තීරණය ලෙස නොසැලකූ බවයි. මෙය තම පාර්ශවයෙන් සිදුවූ අත් වැරැද්දක් බවට පිළිගත් අභියාචක පවසා සිටයේ ඇය අභියාචනාවක් ගොනු කිරීමට ප්‍රථම අදාළ අමාත්‍යාංශ වලින් ප්‍රතිචාර ලබා ගැනීම සඳහා කටයුතු කළ සිටි බවත් එම ප්‍රයත්නය අසාර්ථක වූ හෙයින් කොමිෂන් සභාව වෙතට අභියාචනයක් ඉදිරිපත් කිරීමට පමා වූ බවයි. අභියාචක ඇතුළු අනෙකුත් ක්‍රියාධරයින් සංක්‍රාන්තික යුක්තිය පිළබඳ මතය ප්‍රවර්ධනය කිරීමේදී ඒ පිළිබඳව නිශ්චිත කරුණු නොවූ හෙයින් අපහසුතාවන්ට මුහුණ පෑමට සිදුවූ බව පැවසූ ඇය තවදුරටත් පවසා සිටියේ එවකට පොදු අධිකාරිය සතුව තිබූ තොරතුරු පිළිබඳ නිශ්චිත අදහසක් නොවූ හෙයින් තමා පොදු අධිකාරිය සතු සියලු තොරතුරු ඉල්ලා සිටි බවයි.

TISL හි තොරතුරු නිලධාරී පවසා සිටියේ පොදු අධිකාරිය පනතේ 5(1)(ක) වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රත්ක්ෂේප කළ බවයි

5(1)(ක) වගන්තිය මෙසේ සඳහන් කරයි.

*"එම තොරතුරු තීරණයක් ගෙන නොමැති අමාත්‍ය මණ්ඩල සංදේශයක් සම්බන්ධ වන අවස්ථාවකදී..."*

තොරතුරු නිලධාරියා තව දුරටත් පවසා සිටියේ මෙම වගන්තිය මත තොරතුරු ප්‍රතික්ෂේප කිරීමට පොදු අධිකාරිය එම තොරතුරු පරීක්ෂා කර යුතු අතර, තොරතුරු පරීක්ෂා කිරීමට එය පොදු අධිකාරිය භාරයේ පැවතිය යුතු බවයි.

මේ පිළිබඳව කරුණු පැහැදිලි කළ පොදු අධිකාරිය පවසා සිටියේ 5(1)(ක) වගන්තිය ප්‍රකාරව තොරතුරු ලබා දීම ප්‍රත්ක්ෂේප කළේ තොරතුරු ඉතා පුළුල් පරීක්ෂණයකට භාජනය කිරීමෙන් අනතුරුව බවත් එවකට ඉල්ලා සිටින ලද තොරතුරු වල එවකට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත්ව තිබූ සමහර ලේඛන ද ඇතුළත් වූ බවයි.

ඉන් අනතුරුව කොමිෂන් සභාව පොදු අධිකාරියෙන් වර්තමානයේ අභියාචනය සැලකිල්ලට ගැනීමේදී 5(1)(ක) වගන්තිය ප්‍රකාරව ප්‍රතික්ෂේප කළ හැකි තොරතුරු වල ස්වභාවය විමසා සිටි අතර එයට පිළිතුරු දෙමින් පොදු අධිකාරිය පවසා සිටියේ තමාට ඒ පිළිබඳ නිශ්චිත පිළිතුරක් ලබා දීමට නොහැකි බවත් තමාට ලබාගත හැකි සෑම තොරතුරක්ම අභියාචකට ලබා දී ඇති බවයි. එසේ නොමැතහොත් තමාට විෂය භාර අමාත්‍යාංශ වලින් තොරතුරු රැස් කිරීමට සිදුවන අතර පනත සහ එහි රෙගුලාසි ප්‍රකාරව එය පොදු අධිකාරියේ වගකීමක් නොවන බවයි. පොදු අධිකාරිය තව දුරටත් පවසා සිටියේ නොතීසි ලැබීමෙන් අනතුරුව කොමිෂන් සභාව ඉදිරියේ මෙම තොරතුරු ඉදිරිපත් කළේ කොමිෂන් සභාවේ අධිකරණ බලයට කරන ගරු කිරීමක් ලෙස බවයි.

**නියෝගය:**

මෙම තොරතුරු ඉල්ලීම මගින් ඉල්ලා සිටින ලද තොරතුරු ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලිය පිළිබඳ වන හෙයින් මෙම තොරතුරු මහජන සුබසිද්ධිය තකා ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ.

නීති සම්පාදනය සලකන කල්හි *ගෝමෙස් එ. සමාජ සවිබලගන්වීම්, සුභසාධනය සහ උඩරට උරුමය* (RTIC Appeal/51/2018, 27.02.2018 දින RTIC වාර්තා) පිළබඳ නඩු නියෝගයේ මෙසේ සඳහන් කර ඇත. "*කලාපයේ මෙන්ම අන්තර්ජාතිකවද බොහෝ රටවල්වල නීති සම්පාදනයේදී පනත් ගැසට් කිරීමට පෙර එහි කෙටුම්පත් මහජනතාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍යතාවකි. ඒ මහජන ආකල්ප සහ එකඟත්වය මේ ක්‍රියාවලිය සඳහා වාසිදායක විය හැකි හෙයිනි*" පනතේ 43 වගන්තිය ප්‍රකාරව "නීති කෙටුම්පත්" තොරතුරු ලෙස සලකනු ලැබේ.

06.10.2017 දිනැති අභියාචනය මඟින් අභියාචක, 27.07.2017 දිනැති ලිපිය මඟින් පොදු අධිකාරිය ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත තම තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කල ලිපි කෙරෙහි අවධානය යොමු කරන ලදී. මෙම නිසා අභියාචක මෙම ලිපි කොමිෂන් සභාවට ඉදිරිපත් නොකිරීම ඇයගේ අත් වැරැද්දක් මත සිදු වූ කාරණයක් ලෙසට කරන ලද පැහැදිලි කිරීම කොමිෂන් සභාව පිළිගනු ලබයි. (මෙම ලිපි අභියාචනයේ කොටසක් ලෙස අමුණා නොමැත).

පනතේ 32(2) ප්‍රකාරව අභියාචකට පාලනය කළ නොහැකි හේතුවක් නිසා නියමිත කාලයේදී අභියාචනාව ගොනු නොකිරීම නිසා 32(1)(අ) වගන්තිය ප්‍රකාරව පොදු අධිකාරිය විසින් අභියාචනය ඉදිරිපත් කිරීම කල් ඉකුත් වීම පිළිබඳ ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශයට පිළිතුරු දැක්වූ අභියාචක පවසා සිටයේ ඇය අභියාචනාවක් ගොනු කිරීමට ප්‍රථම අදාළ අමාත්‍යාංශ වලින් ප්‍රතිචාර ලබා ගැනීම සඳහා කටයුතු කළ සිටි බවත් එම ප්‍රයත්නය අසාර්ථක වූ බවයි.

පනතේ 32(2) ප්‍රකාරව කල් ඉකුත් වීම පිළිබඳව අභියාචක විසින් ඉදිරිපත් කරන ලද මෙම පැහැදිලි කිරීම පිළිබඳ කොමිෂන් සභාව සෑහීමකට පත් වේ. තවද මෙම පනත ශ්‍රී ලංකාවේ මහජනයාට සහ පොදු අධිකාරීන්ට තවමත් ආධුනික පනතක් වන අතර මෙහි ඇති ක්‍රියා පටිපාටීන්ට හුරු වීමට සියලු දෙනාටම කල් ගත විය හැකි බවට සිහි කර සිටිමු.

කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කර ඇති තොරතුරු සැලකිල්ලට ගැනීමේදී පැහැදිලි වන්නේ 18/0430/702/008 දරන 05.03.2018 දිනැති වන්දි ලබාදීමේ කාර්යාලයක් ස්ථාපනය කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල සංදේශය අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යවරයා අත්සන් තැබූ වන හෙයින් පනතේ 3 වගන්තිය ප්‍රකාරව මෙම තොරතුරු පොදු අධිකාරිය "භාරයේ, සන්තකයේ සහ පාලනයේ" (එනම්; අග්‍රාමාත්‍ය කාර්යාලය) ඇති තොරතුරු විය යුතු බවයි.

06.05.2018 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වන්දි ලබා දීමේ කාර්යාලයක් ස්ථාපනය කිරීමට අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් පරිදි එහි 1 වන ඇමුණුමට අදාලව නීති කෙටුම්පත් කිරීමට නීති සම්පාදකයින්ට උපදෙස් ලබා දී ඇති බවට කොමිෂන් සභාව තවදුරටත් නිරීක්ෂනය කරයි. *ගෝමෙස් එ. සමාජ සවිබලගන්වීම්, සුභසාධනය සහ උඩරට උරුමය* හි නියෝගය සැලකිල්ලට ගැනීමේදී පොදු අධිකාරිය මෙම නීති කෙටුම්පත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම පැසසීමට ලක් කළ යුතු කරුණකි.

අභියාචනය 10.07.2018 දින ප.ව. 3.00 ට කල් තබන ලදී. අභියාචකගේ තොරතුරු ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබූ හෙයින් එදිනට ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශයන්හි තොරතුරු නිලධාරීන්ට කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙසට මෙයින් නියෝග කර සිටිමු.

****